


**පිදුම:**

*ලිංගික ශ්‍රමිකයින් මනුශ්‍යයන් ලෙස සලකන සියල්ලන්ට......*

# පෙරවදන.

ශ්‍රී ලාංකික සංධර්භය තුල ලිංගික ශ්‍රමිකයින් ස්ථානගත කර ඇත්තේ කේසේද යන්න පිලිබඳව විග්‍රහකර ගැනීම පදනම් කර ගනිමින් මෙම මැදැහත්වීමේ අවශ්‍යතාවය හා වැදගත්කම සලකා බැලේ.

මෑත ඉතිහාසය දෙස බලන විට සාමාජීය වශයෙන්, සමාජ සාරධර්මයන්හි " හොද " හා " නරක " යන සංධර්භය තුල ලිංගික ශ්‍රමය සදාචාර පදනමකින් " නරක " ලෙස පිටු දැකීම අප සමාජයට ආවේනික ලක්ෂණයකි.

එමෙන්ම සාමාජීය කාරණාවෙන් එහා යමින් ආගමිකව " පිං" සහ "පව්" යන කථිකාවතුල මෙම ශ්‍රමය සැපයීම පව්කාර කටයුත්තන් බව දැඩි කථාබහක් පවතින අතර ඒ තුල ලිංගික ශ්‍රමය ශාපලත් රැකියාවක් බවට ආගමිකව පිලිගනී.

අනෙක් අතින් සංස්කෘතිකව "තත්වය" යන එසෙත් නැතිනම් "ශිෂ්ඨබව" යන අර්ථයන් හොද තත්වය නරක තත්වය එසේත් නැතිනම් ශිෂ්ඨ, අශිෂ්ඨ යන තර්කයන් තුල පහත් තත්වයකින් හා අශිෂ්ඨ බවකින් යුතු රැකියාවක් ලෙස ලිංගික ශ්‍රමය අර්ථ දක්වයි.

එමෙන්ම වර්ථමානය වන විට ලෙඩ රෝග පතුරවමින් හුදෙක් මානව වර්ගයාගේ සෞඛ්‍ය ආරක්ෂාවට තර්ජනයක් ඇති කරන්නන් ලෙස අර්ථ දැන්වීමක් මෙම ශ්‍රමිකයින් මත පටවා ඇත.

ඒ අනුව සමාජ ආචාරධර්මයන්ට පටහැනි , ආගමිකව පව්කාර හා ශාපලත් ,සංස්කෘතිකව අශිෂ්ට හා තත්වයෙන් ඉතාම පහත් ලෙඩරෝග බෝ කරනු ලබන මෙම ශ්‍රමිකයින් අපරාධ ක්‍රියාවලියක නිරත වන්නන් හා සාපරාධි ක්‍රියාවක නියැලෙන්නන් බවට අර්ථ දක්වා ඇත.

පවතින තත්වය අනුව නීතිමය රාමුව සකස් වූයේ ලිංගක ශ්‍රමිකයින් දැඩි ලෙස හෙලා දකිමින් අපරාධ පාලනය කිරීමේ ප්‍රවේශයකිනි. ඒ අනුව ඒවා ක්‍රියාත්මක වනුයේ සමාජයේ වැඩිහිටියන් , ආගමික නායකයින් , සෞඛ්‍යය ක්ෂේත්‍රයේ නියැලෙන්නන් ආදී බහුතර කොටස් සතුටු කිරීමට පමණක් වන අතර සිවිල් නීතීන් අභිබවා යමින් අපරාධ නීතීන් ලෙසයි. එම නිසා පවතින නීතීන් අළුපාට , අපැහැදිලි ඒවා වන අතර නීතිය පසිදලන්නන් හිතු මනාපය අනුව මෙය නීති විරෝධි ක්‍රියාවක් ලෙස පෙන්වා දී ඇත.

ස්ත්‍රීවාදී සාකච්ඡාවන්තුල, මෙම ලිංගිකශ්‍රමය පැවතීම කාන්තාවන් සූරාකෑමක් ලෙස විග්‍රහ කල අතර එහිදී සිදුවන හිංසනය පිලිබද බරපතල ලෙස සාකච්ඡාවට බදුන් විය. අනතුරුව ගොඩ නැගෙන ලද ස්ත්‍රීවාදී සාකච්චාව තම ශරීරයට හා කැමැත්ත පිලිබද සාකච්චාවට බදුන් කල අතර එහිදී ශරීරයට ඇති අයිතිය හා ඒ පිලිබද තීන්දු තීරන ගැනීමට ඇති අයිතිය පිලිබද මතවාදයක් ගොඩ නැගිනි. තෙවන සංවාදය තුල ලිංගික හැසිරීම් පිලිබද ඉතා ධනාත්මක විග්‍රහයන් ඉදිරිපත් වු අතර එහිදී ලිංගික තෘප්තිය අයිතියක් ලෙස සාකච්චාවට බදුන් වීය. අනතුරුව පැමිනි සාකචචාව විශේෂයෙන් බටහිර ලෝකය තුලින් ගලා ආ අතර එහිදී ලිංගික ශ්‍රමය සැපයීම, කැමැත්ත හා තෝරා ගැනීම ලෙස ගෙන මතවාදයක් ගොඩ නැගිනි. කෙසේ වුවද අවසාන වශයෙන් වර්ථමානය වන විට බහුතර පිරිස විසින් ලිංගික ශ්‍රමිකයින් හදුනා ගනු ලබන්ගේ වින්දිතයින් ලෙසත් ඔවුන් ගලවා ගතයුතු හා මුදාගතයුතු කණ්ඩායමක් ලෙසයි.

ඉහත තත්වය තුල මෙම ක්‍රියාවලියෙහි පවතින ශ්‍රමය , අයිතිය හා හිමිකම යන කාරනා බරපතල ලෙස යටපත්වන අතර ශ්‍රම වෙළදපොළතුල හෝ වැඩ ලෝකයතුල මෙම ශ්‍රමය ස්ථාන ගත කිරීමට ඇති සියළු දොරවල් වැසී යනු ලබයි.

එම තත්වයතුල, මෙම ශ්‍රමිකයින්ට අයිතියක් පවතීද ? ලිංගික ශ්‍රමය වෘත්තියක් වශයෙන් සැලකිය හැකිද ? එම වෘතීයෙහි නියැලීමට අයිතියක් තිබේද? යන කාරනා පිලිබද බරලතල සංවාදයක් මෙම ශ්‍රමිකයින් තුලත් ඉන් පරිභාහිරවත් පවතී.

------------------------------.............................------------------
------------

***මෙවන් අතිදුෂ්කර හා සංකීර්න පසුබිමක් තුල මෙම වෘත්තියේ තව දුරටත් නියැතී සිටින ශ්‍රමිකයින් කොරෝනා ව්‍යාවසන තත්වය තුළ තම ජීවිතය ගැටගසා ගැනීම වෙනුවෙන් ඉතා බරපතල වූ හුදකලා සටනක නියැලුනි. වියින් විට එක් එක් ප්‍රදේශ ඉලක්කකර ඇදිරි නීති තත්වයන් ප්‍රකාශ කල අතර සංචරන සීමාවන්ද තදින්ම බලපැවැත්වුන අතර තත්වය එසේ තිබියදී බොහො ශ්‍රමිකයින් ඔවුන්ගේ සේවා සිථාන වලම කොටු විය.***

***එම තත්වය තුළ කොරෝනා පිලිබදව පවතින බිය මෙන්ම ඒ හා සම්බන්ධිත නිරෝධායන විධි විධාන ඉතා තදින්ම බල පැවැත්වන්නට යෙදුනු අතර මෙම ප්‍රජාව කරකියාගත නොහැකිව අසරන විය.***

***එවන් ලිංගික ශ්‍රමිකයන්ගේ වෙව්ලන දෑගිලි අතර හිර වු පන්හිද පමනක්ම දැනගත් ඔවුන්ගේ කටෝර අත්දැකීම් හා ඔවුන්ගේ ලේ , කදුළු, දහදිය අතරින් බොඳ වූ සිහින පිලබද හෙලිදරව්වක් , පත් ඉරු අතර සැගවෙන්නට ඉඩ නොදී, ''ලිංගික වෘතීකයෙකුගේ දින පොත'' ලෙස මෙම කෘතිය හරහා එලි දකී.***

------------------------..............................--------------------
-----------

# පටුන

***..ලිංගික ශ්‍රමිකයින් 10 දෙනෙකු විසින් ලියන ලද දින පොත් සටහන් 237 ක් අතුරින් තෝරා ගත් අතීශය කටෝර සිද්ධීන් 30 ක් මෙහි සදහන් වේ..***

01 ''වීදිය භාවිතා කරමින් රැකියාවේ නිරත වන අපට දෛනික රැකියා සොයා ගැනීමට බැරි වුනා..''

02 ''සම්භාහන සේවා ආයතන විවෘත කිරීමට කිසිසේත්ම ඉඩ දුන්නේ නැහැ..''

03 ''හතර වටේ ඇවිදල එනඋන් බෝඩිමේ තියාගෙන අවධානමක් ගන්න බෑ කියල, අපිට බෝඩිමෙන් බැහැල යන්න කීවා..''

04 ''ග්‍රාම සේවක 10 වතාවකට වැඩිය 5000 ගන්න ගියාම හරවල එව්වා..''

05 ''අපි වැඩකල තැන කාත් කවුරුවත් නැතිව කොටු වුනා..''

06 ''පොලිසිය ජනේලයෙන් පැනල ඇවින් අපිට අතවර කළා..''

07 ''මසාජ් එක අරින්නම බැරි තැන , මම ගාමන්ට් ෆැක්ට්‍රියක වැඩට ගියා . යන්නම් සතියයි යන්න උනේ මට කෝවිඩ් හැදුනා..''

08 ''දොරවල් වහගෙන ඇතුලේ ඉන්න අපි ගෙනිහින් උසාවි දැම්මා..''

09 ''නීතිය ක්‍රියාත්මක වුනේ එක එක තැන්වල එක එක විදිහට...''

10 ''පොලිසිය සැරින් සැරේ , දෙතුන් විදිහකට අපට දඩ ගැහුවා..''

11 ''කුඩුවෙන් එලියට එනකොට කඩවල් ඔක්කොම වහලා.. කිසිම දෙයක් ගන්න විදිහක් තිබුනේ නැහැ...''

12 ලොක්ඩවුන් වෙලා ඉද්දී කන්න බොන්න විධියක් තිබුනෙම නැති තැන , වටපිටාවෙන් කස්ටමස්ලා කීපදෙනෙක් හොයා ගත්තා . අන්තිමට මට කෝවිඩ් හැදුනා.

13 ''කුඩුවලට ඇතුලට දානව කියල මගේ ලඟ තිබුන සල්ලි ටික ඔක්කොම ගත්තා...''

14 ''කන්න නැතිව නිදාගෙන හිටිය, මගේ කාමරේ දොර කඩාගෙන පොලීසිය පැනල මුළු කාමරේම ඇදල බැලුවා..''

15. ''නිරෝධායන මධ්‍යස්ථානයේදී හමුදා කාරයෙක් ඇවිත් මාව බදා ගත්තා.''

16 ''අද ආවේ නැත්නම් දවස් 14 කට යවනවා කියල, මට ලිංගික හිරිහැර කළා...''

17 ''අපි අරගෙන ගියේ කුනු හරුපෙන් බැන, බැන, අතින් පයින් ගහ ගහ...''

18 ''අන්තිමට මාළු 500 ටත් මට අන් එක්ක නිදියන්න උනා...''

19 ''කවදාවත් අපිව ගෙනියද්දි පොලිස් කාන්තාවක් ආවේ නැහැ.''

20 ''සල්ලි දෙන්න බැරි නිසා මාව කාමරෙන් එලියට දැම්මා..''

21 ''මොකක්දෝ ආයතනයකින් ඇවිත් සහනාධාර බෙදුවා. මම එක ගන්න ගියාම මාව හරවල එව්වා.

22 ''කැරොකිවල වැඩ තිබුනා..'' ඒත් ඒවට ඇතුල් වෙන්න මට සල්ලි තිබුනේ නැහැ...''

23 ''කටඋත්තරයක් ගන්න කියල එන්න කියල මාව හිරේ දැම්මා.''

24 ''කරකියාගන්න දෙයක් නැති කමට කියන කියන දේ කරන්න උනා.. අන්තිම මේ දරුවා මගේ බඩට ආවා..''

25 ''අපි ඔක්කොම එකම කූඩුවකට දැම්මා.. කෙලින් හිටගෙන ඉන්නත් එතන ඉඩ නෑ..''

26 ''බෝඩිං සල්ලි දෙන්න විධියක් නෑ කිව්වම බෝඩිම බලා ගන්න එකා රෑට කාමරේට එන්න ගත්තා.''

27 ''පොළි කාරයට වාරික සල්ලි දෙන්න බැරිව ගියාම, උගේ යාළුවන්ට මාව දුන්නා''

28 ''ගම්වලට යන්න දාපු ඉස්වන නැගල ඔක්කොම වගේ ගම්වල ගියා. මම කොහේ යන්නද..''

29 ''අද කෙල්ලෙක් දෙන්න බැරිනම් , බෝතයක් දීපන් කියල පොලිස් කාරයා කරදර කළා..''

30 ''අද මට ජොයින්ට් එකක් හොයා ගන්න විධියක් තිබුනෙම නෑ.. අන්තිමට පොලිස් කාරයෙක් ගෙනත් දුන්නා..''

# 01

(බට්ටිගේ දින පොත - 2020 / 02 / 02 )

***''වීදිය භාවිතා කරමින් රැකියාවේ නිරත වන අපට දෛනික රැකියා සොයා ගැනීමට බැරි වුනා..''***

මේ බෝඩිං කාමරේට කොටු වෙලා අදට දවස් 12 යි. අද වරුවකට කඩවල් ඇරපු නිසා, ඕන මගුලක් උනාදෙන් කියල මම එලියට බැස්සා. කාරරෙන් එලියට බහිද්දි කොහෙද යන්නේ කියල මට කිසිම අදහසක් තිබුනේ නෑ. මම ඔහේ ඇවිදගෙන පුරුදු පාර පැත්තටම ගියා. වෙනද බොරුවට හරි හිනාවෙලා ගුඩ්මෝනින් බට්ටි කියන ත්‍රිවිල් අයියත් එතන නෑ. මම බස් හෝල්ට් හක ලඟ පුදුම වෙලාවක් හිටගෙන හිටියා, වතුර ගොදක් වත් නැතිව. එකෙක් වත් මගේ දිහා නිකමටවත් බැලුවේ නෑ. මිනිස්සු පිස්සෝ වගේ ඇවිත් කඩවල් වලින් බඩු අරගෙන මලු පිටින් අරගෙන යනවා. මට කාමරේ කරට උගුරක් බොන්න සීනි ඇටයක් නැති තැන මම අද එලියට බැස්සේ. නමුත් කිසිම වැඩක් ලැබුනේ නැහැ.

හිටලෙන ඉන්න මම දිහා බලල එකෙක් කියාලෙන ගියා. ''තොපිට පිස්සුද මේ දවස් ටිකේ වත් ඉන්න බැරි තරම් මෝල්ද ? '' කියල. උන් හිතන්ගේ අපි උන් එක්ක යන්නේ අමාරුව ඇරගන්න කියල. මට ආපහු හැරිල යන්න හිතුනත් මම ගිහින්

මොනව කරන්නද? ඒ වෙලාවෙත් මම පුදුම බඩගින්නකින් හිටියේ.
බැරිම තැන මට කස්ටමස්ලා හොයල දෙන මාලක අයියට කතා කළා. අයියෙ මම දවස් ගානකින් හරියට මොකුත් කෑවේ නෑ.. දැනුත් මට කලන්තේ වගේ පුදුම බඩගිනියි. පුළුවන්නම් මට කීයක් හරි දෙන්න . වැඩක් ආවම කපා ගන්න. '' කියල මම කීවාහම උෟත් , තරහෙන් වගේ , ''මේ දවස් වල ඉතිං කපා ගන්න වෙන්නේ ගලක් තමයි. කමක් නෑ ටිකක් හිටපන්කෝ , කියල ඇවිත් රුපියල් 500 ක් දීලා ගියා. මම ඒක අරගෙන හාල් කිලෝ දෙකකුත් , පරිප්පු දෙසිය පනහකුත්, සීනි දෙසිය පනහකුත්, රුපියල් 50 ෆෝන් කාඩ් එකකුත්, තේ කුඩු ග්රෑම් 50 කුත් , රුපියල් 50 පොල්කිරි පැකට් එකකුත් අරගෙන බෝඩිමට ආවා. මේ දවස් වල මිනිස්සු පාරෙත් නැහැ. වැඩිවෙලා පාරේ හිටගෙන ඉන්නත් බැහැ. පොළිසියට අහු උනොත් කෙලින්ම කන්දකාඩු යවනවා. පරිප්පුයි බතුයි කාල හරි මේ බඩු ටිකෙන් දවස් තුනක්වත් ඉන්න බැරිවෙයි. පාරේ ඉදල කීයක් හරි හොයා ගන්න අපි කොහොමද ජීවත් වෙන්නේ දෙවියනේ....

# 02

(අමාගේ දින පොත - 2020 / 02 / 04 )

***''සම්භාහන සේවා ආයතන විවෘත කිරීමට කිසිසේත්ම ඉඩ දුන්නේ නැහැ..''***

ලොක් ඩවුන් එක පටන් ගත්ත දවසේ ඉදලම අපි මේක ඇතුලේ. එක අතකින් පිංකියි , පොඩ්ඩියි හිටපු එක හොදට ගියා . අන්තිම දවසේ හොයා ගත්ත සල්ලි ටික නොතිබුනානම් අපි ඉවරයි. අපි මේක ඇතුලේ ඉන්නවා කියල එක එකා දැන ගත්තොත් අනිවාර්යයෙන්ම පොළිසිය දැන ගන්නවා . එහෙම උනොත් අපිට යන්න තැනක් නැති වෙනවා.. පොළිසිය කියල තියෙන්නේ , උබලට ඕව ආයේ අරින්න වෙන්නේ ඊලඟ ආත්මේ තමයි. ඒක නිසා ඕව වහග දාල ඕත තැනක යමල්ලා. ඕවගේ ඉදල අහුවෙන්න එපා කියල.
ඉතිං පසුගිය වාර දෙකේම වගේ මම රෂෝ මල්ලිට කථා කරල එන්න කියල දොර යටින් සල්ලියි , බඩු ලිස්ට් එකයි දැම්මා.. ඒ අතේ තිබුන අන්තිම සල්ලි ටික.. රෂෝ මල්ලිට වෙනද දෙන රුපියල් 500 පස්සේ වෙලාවක දෙන්නම් කීවා ..
ටික වෙලාවකින් රෂෝ කතා කරල කීවා, කෑම බඩු ටික නම් ගත්තා . අනික් ඒව නම් ගන්නවා බෝරු, උන් ලොකු ගණන්

කියනවා කියල. මේක අස්සේ හිරවෙලා ජොයින්ට් එකක්වත් නැතිව කොහොමද ඉන්නේ. පහු ගිය දවස් ටිකේ හැමතැනම වහල තිබුන නිසා මොකුත්ම කරනියාගන්න දෙයක් තිබුනේ නැහැ. අදත් මේ වරුවෙන් පස්සේ ගව කීදවසක් වහයිද දනනෙ නැහැ. මෙහෙම ගියොත් අපි තුන්දෙනාට බෙල්ලට වැලක් දා ගන්න තමයි වෙන්නේ කියල පිංකි කියපු නිසා, මම ආපහු රෂෝව ගෙන්න ගත්තා.

මගේ ලග වටිනා කියන දේකට සන්තකේටම තිබුනේ අතේ තිබුන මුද්ද විතරයි. මම ඒක දීලා කිව්වා ගන්න පුළුවන් ගානක් අරන් ජොයින්ට් තුනක් අරන් වරෙන් කියලා.

අනේ උඹ මට බඩු ටිකත් එක්ක ඉතුරු සල්ලි කියල ගෙනත් දුන්නේ රුපියල් 900 ක් විතරයි.

ඊ ලඟට මොනව කරන්නද කියල හිතාගන්න බෑ..

# 03

(සදාගේ දින පොත - 2020 / 02 / 04 )

*"හතර වටේ ඇවිදල එනඋන් බෝඩිමේ තියාගෙන අවධානමක් ගන්න බෑ කියල, අපිට බෝඩිමෙන් බැහැල යන්න කීවා.."*

අද දවස මහ කාළකන්නි දවසක්. දවස් ගානකට පස්සේ උදෑසනම මම නැගිට්ටා. බෝඩිමේ තියෙන වැඩ ටික ඉවර කරල එලියට බහින්න ඕන කියල හිතාලෙන තමයි නැගිට්ටේ. රෙදි බේසමත් අරගෙන ටැප් එක ලඟට යද්දී බෝඩිමේ ඇංටී ඉස්සරහට හම්බවෙලත් අහක බලා ගත්තා. අනිත් උන් එක්ක වගේ බජනයක් නැති උනත් වෙනද මාත් එක්ක කට කොනකින් හරි හිනා වෙනවා. අද එහෙම මඟ ඇරල ගිය එක එච්චර මට ඇල්ලුවේ නෑ. මට රෙදි ටික හෝදල ඉවර වෙනකල්ම ඕකමයි මතක් වුනේ. කොහොම හරි රෙදි ටික හෝදගෙන උඩ වැල ලඟට හියා රෙදි ටික දාන්න. එතන ශ්‍රීයාලතා අක්ක කලින් දවසේ රෑ හෝදපු රෙදි වනමින් හිටියා. මම ගියාට පස්සේ කින්ඩියට වගේ හිනාවෙලා ,, කොහොම හරි ටිකට් එක කපා ගත්ත නේද ,, කියල ඇහුවා. මම රෙදි බේසම බිමින් තියල ඇයි එහෙම කියන්නේ කියල ඇහුවා. ඒකි එක පාරටම කිව්වා ඇංටි කිව්වා උඹ බෝඩිමෙන් යවනවා කිව්වා කියලා. ඇත්තටම මට ඒකිගෙන් කිසි දෙයක් අහන්න මතක් වුනේ නෑ. පුදුම අසරනකමක් දැනුනේ . අතේ සතේ නෑ. කරන්න වැඩක් එන්නෙත් නෑ.. කොහොම උනත් බෝඩිමේ වැඩටික ඉවර කරල, ඇන්ටිට මූන දෙන්නේ නැතිව බෝඩිමෙන් පැන ගත්තා.

ඇවිල්ල, පුරුදු තැනට පයින්ම ඇවිදගෙන ගියා වෙනද නම් මම එතනට යන්න ත්‍රීවිල් එකක් ගන්නවා . අද මට ඊකටවත් අතේ සතේ නෑ. එතන හිටගෙන පැයකට වඩා හිටියා. බඩගින්නට කළන්තේ වගේ. ඊත් උදේ උන සිද්ධියත් එක්ක මට එකන ඉන්න හයියක් ආවා. ටික වෙලාවකින් වාහනයක් මා දිහා බල බල ගිහින් ටිකක් දුරට ගිහින් නතර කළා. මාත් ටික ටික ඉස්සරහට ගියා. මට ඕන උනේ මේ වැඩේ කොහොම හරි සෙට් කරගන්න. ලගට ගියාම ඒ මනුස්සය වීදුරුව පහත් කළා. මම හිනා උනාම දොර ඇරියා. මම නැලග ඉද ගත්තා. ටික දුරක් ගියාම ඇහුවා දන්න තැනක් තියෙනවද කියල. මම ඔව් කිව්වා. මට තේරුනා මේ මනුස්සය මෙහේ නේමේ කියලා.

මම කියපු තැනට ගිය එක මට සහනයක් වුනා. නුපුරුදු තැන් වලට යන්න උනාම වැඩේ බවර වෙලා එනකල් කිසිම විස්වාසයක් නෑ මොනව වෙයිද කියල. මම ගිය ගමන් ඇහුවා, කන්න මොනවත් නැද්ද කියල. ඊට පස්සේ ඒ මනුස්සය වාහනේ තිබුන බිස්කට් එකක් අරගෙන ඇවිත් දෙන ගමන් කන්න දීල වැඩේ ගන්නද , සල්ලි දීල වැඩේ ගන්නද කියල ඇහුවා .මම මහා අවිනිෂ්චිත බවක හිටිය නිසා මොකවත් කියන්න ගියේ නෑ.

වැවේ ඉවර වෙලා මාව හිටපු තැනට ඇරලුවා. මට රුපියල් 3000 ක් වැඩේට දුන්නා. මම බැස්ස කන්න මොනව හරි හොයන්නයි උත්සාහ කලේ. වෙනද ඇරල තියෙන කෑම කඩ 03 නම වහලා . නරන්න කිසිම දෙයක් නෑ . ටිකකින් චූන් පාන් වෑන් එකක් ආවා. මම මාළුපාන් ගෙඩි දෙකක් ගත්තා. ඊන කාළ එහාට මෙහාට කොපමණ ගමන් කලත් හවස්වන විටත් කිසිම කස්ටමර් කෙනෙක් හමුවුයේ නැහැ. මම දන්න ත්‍රීවිල් මල්ලිට කෝල් කරාම එයා ආවා. ඇවිත් බොඩිම ලඟට ඇරලව ගත්තා. ත්‍රීවීල් එකට රුපියල් 350 ක් දුන්නා. අගේ ඉතිරි උනේ 2650 යි.

මම ඉක්මනින් ඇගපත හෝදගෙන කාමරේ අස්සට පැල ගත්තා. දොර වහගෙන ටිකක් නිදා ගත්තා. මට ඕන උගේ ඇන්ටිට හොරෙන් කාමරේට වෙලා දවසක් හරි පන්නගන්න. අනේ මට පැයක්වත් නින්ද ගියේ නැහැ. දොරට ගහන සද්දෙට මාව ඇහැරුනා. බලද්දී ඇන්ටි. ඔන්න ඉතින් පටන් ගත්තා. ඔයාට එක තැනක ඉන්න බැහැනේ , මෙච්චර රටේ ලෝකේ ප්‍රශ්න තියෙද්දි නරකාදියේ යනවා. මේකේ අනික් උන්ගේ ආරක්ෂාව මම බලන්න ඕන. කරුණාකරල හෙට හවස්වෙද්දී කාමරේ හිස් කරල ඕන. ,, කියල බැන ගෙන බැනගෙන ගියා .. මේ ගෑනි කියපුව මට මතකත් නෑ ඒ තරමට කියෙව්වා. වෙනද නම් මම කුනුහරුප දෙකක් කියනවා . නමුත් මොනව කරන්නද . එහෙම කරල මට මේ මොහොතෙම යන්න තැනක් නෑනේ.. මම කරබාගෙන එයා ගියාම ආයේ දොර වහ ගත්තා.

හෙට මම මොනව කරන්නද කියල දන්නේ නැහැ....

# 04

(අමාගේ දින පොත 2021.02.19 )

*"ග්‍රාම සේවක 10 වතාවකට වැඩිය 5000 ගන්න ගියාම හරවල එව්වා.."*

අද මේ තිරිසන් ග්‍රාමසේවකයා හම්බවෙන්න ගිය 08 වෙනි දවසද කොහෙද. මට නම් අද ඇති වුනේ පුදුම තරහක්. මිනිස්සු මෙහෙම කරනකොට මරාගෙන මැරෙන්න හිතෙනවා. දවස් ගානකින් කිසිම වැඩක් හොයා ගන්න බැරි වුනා. ඒකයි රුපියල් 5000 දෙනව කිව්ව ආරංචියට ග්‍රාමයා හම්බවෙන්න ගියේ . පලවෙනි දවසේ ගියාම අනික් ඔක්කොම ගනකල් මාත් එන්න කිසිම දෙයක් කථා කලේ නෑ. ඔක්කොමල ගියාම, මගේ කකුල් දෙකේ ඉදල ඔළුවට එනකල් මහ නරකාදි විදිහට බැලුවා. එහෙම බලල මෙහේ ස්ථිර පදිංචියක් නෑ නේද කියල ඇහුවා. මම නෑ කිව්වම , එහෙනම් ඉතිං ආවේ, කියල ඇහුවා. 5000 ක් දෙනව කිව්ව ආරංචියට ආවේ, අපිත් මොනව හරි කාළ ජීවි වෙන්න ඕනනිසා ආවේ කිව්වම , ඌ සමච්චලේට වගේ කටකොනකින් හිනා වෙලා ඒ තරම් කෝඩේ ද , කියල ඇහුවා.. මම සද්ද නැතිව හිටියේ මට කර කියා ගන්න කිසිම දෙයක් නැති නිසා.. ඊට පස්සේ ඒ මිනිහා අහක බලාගෙන කොළ කෑල්ලක් දික් කරල කිව්වා,, මේක බලාගෙන මේ අභියාචනය පුරවගෙන ගෙනත් දෙන්න කියල.. මම ඊ ලඟ දවසේ ඒ විදිහට ලියුමක් ලියා ගත්ත, අල්ලපු ගෙදර එක්කෙනෙක්ට කියලා . ඒක ලියව ගන්නත් නොවිදිනා වැදුම් වැන්දා.. එදාම හවස ග්‍රාම සේවක මුන ගැහෙන්න ගියා.. ඊට පස්සේ කාර්‍යාලය තියෙන ගෙදර එකා කිව්වා ,, දැන් කොහෙද ග්‍රාම සේවක කෙනෙක් කියල.. මම කිව්වා ග්‍රාම සේවක ඔයාලට දීල යන්න කියල,, කිව්ව කියල. ඒවා අපි දන්නේ නෑ ග්‍රාම සේවකටම දෙන එකයි ඇත්තේ කිව්වා... මම හොදටම දන්නවා ගමේ අනික් අයගේ අභියාචනා මේ මිනිස්සු භාර අරගෙන ග්‍රාම සේවකට දෙනවා.. ඒත් මේ මිනිස්සු මගේ එක භෑර ගත්තේ නෑ. මට පුදුම දුකක් ලැජ්ජාවක් මම ගැනම ඇති වුනේ. මොනව කරන්නද එදත් ආපහු හැරිල ආවා..

ඊට පස්සේ තුන් හතර වතාවක් ගිහින් තමයි මම ග්‍රාම සේවකට ලියුම භාර දුන්නේ.. පස්සේ මම තව දවස් දෙකක් ගියා මොනවද වුනේ කියල අහන්න.. ඒ හැම දවසකම හිත රිද්දගෙන තමයි ආවේ.. පස්සෙ මට ආරංචි වුනා 5000 දෙනවා කියල.. එදා මම පැය ගානක් පෝලිමේ ඉදල ,, මගේ වාරේ ආවම කිව්වා.. පස්සේ අභියාචනා දාපු අයට අද දෙන්නෙ නෑ කියල. එදා මම තේ උගුරක් වත් නැතිව හාමතේ ඔය පොළීමේ හිටගෙන හිටියේ.. මම දැනුන වේදනාව කියල වැඩක් නෑ.. මම ඉතින් කරබාගෙන එදත් ආපහු හැරිල ආවා.. ඊට

දවස් දෙකකට පස්සෙත් ආරංචි උනා ආපහු නොදුන්නු අයට 5000 දෙනවා කියල.. එදත් ගිහින් පෝලිමේ හිටගෙන හිටියා පැය ගානක් හිටගෙන හිටියට පස්සේ පොළිමේ මගේ වෙළාව කිට්ටු වෙද්දි කිව්වා ,. සල්ලි ඉවරයි ,, ඉතිරි අයට දේන්න වෙන්නේ ආපහු සල්ලි ලැබුනම තමයි කියල..

ඊට පස්සේ තමයි අද ගියේ . අදත් 50කට වැඩි ගානකට දීල ඉවර වෙනකල් ඉන්න උනා මගේ වෙළාව එනකල් .. මම හැමදැම මෙතන රස්තියාදු වෙලා ගිය දවස් වලට හිතුවා,, ඊලඟ දවසේ නම් වේලාසනින් ඇවිත් පෝළිමේ හිට ගන්නවා කියල.. ඒත් එක දවසකවත් කිසි එකෙක් ග්‍රාමයා ඇවිල්ල කියල මට කියන්නේ නෑ.. මට ආරංචි වෙනකොට පෝළිම කිලෝ මීටරයක් විතර හැදිල ඉවරයි. අදත් වුනේ ඒ ටික .. ඒත් මොනව කරන්නද කියල හිටියා .. අන්තිමට මගේ වෙළාව ආවම ග්‍රාමයා මගේ අයිඩින්ටීටී කාඩ් එක අරගෙන එගෙට මෙහෙට උගේ කොළ ටික පෙරලල කිව්වා .. ලිස්ට් එකේ මගේ නම නෑ කියල..
මෙච්චර දවස් රස්තියාදු වෙළා මට අහගන්න වුනේ මේ ටික. ඇත්තටම උන් හිතා මතාම තමයි මගේ නම නොදෑවේ.. මට උගේ අම්ම මුත්තා මතක් කරන්න හිතුවත් ,, මම කරබාගෙන ආපහු ආවා.. මොකද මම දන්නව මම එහෙම කලානම් එතන හිටිය අනික් අම්මන්ඩිල ටිකත් මගේ කරේ නගින්න එනවා..

# 05

(ලිහිණියගේ දින පොත 2021.02.21)

***"අපි වැඩකල තැන කාත් කවුරුවත් නැතිව කොටු වුනා.."***